# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1654/21 - 2010 මැයි 20 වැනි බ්‍රහස්පතින්දා - 2010.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ
### ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සංස්ථාපනය කිරීම

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශයේ ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි තව දුරටත් පුළුල් කොට වඩාත් විශිෂ්ට හා ඵලදායී සේවාවක් ඉටු කර ගැනීමේ අරමුණ ඇතිව ඉඩම් හා ඉඩම් සංවර්ධන ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2009.06.24 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අංක අමප/09/1222/336/019 දරන 2009.11.26 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දෙන ලද අනුමැතිය ප්‍රකාරව ඉඩම්, ඉඩම් සංවර්ධන ජනාවාස හා රණවිරු සුභ සාධන අමාත්‍යාංශය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 2010.01.01 වැනි දින සිට සංස්ථාපනය කළ බව සියළුම මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

2009.12.31 වැනි දින තෙක් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය විසින් ඉටු කරන ලද පහත සඳහන් විෂයන්ට අදාළ රාජකාරි කටයුතු :–

1. ශ්‍රී ලංකාව සඳහා සම්මත කරගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම ;
2. ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම ;
3. සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත්, පාරිසරික සමතුලිතතාව රැකෙන පරිදිත් භාවිතා කිරීමට හැකිවන පරිදි උචිත තාක්ෂණික මග පෙන්වීම් සිදු කිරීම ;
4. භූමිය පදනම් කරගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ හා නියෝග නිකුත් කිරීම ;
5. විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳව දැනුම, පුහුණුව හා අධ්‍යයනය පුළුල් වන පරිදි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

සහ ඉහත විෂයයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු 2010 ජනවාරි මස 01 වැනි දින සිට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මගින් සිදු කරනු ලැබේ.

*ලිපිනය :*

අධ්‍යක්ෂ, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව,
අංක 31, පතිබා පාර, නාරාහේන්පිට, කොළඹ 05.
*දුරකථන අංක :* 011 2587236, *(අධ්‍යක්ෂ)*
011 2500338 *(පොදු)*

2010 මැයි මස 13 වැනි දින,
බත්තරමුල්ල,
අංක 80/5, රජමල්වත්ත පටුමග,
"ගොවිජන මන්දිරය",
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ටී. අශෝක පීරිස්,
ලේකම්.

06-96


1A - G 12871— 360 (2010/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.